# “අපි වවමු - රට නගමු”

## කිතුල් කර්මාන්තය සංවර්ධනය කිරීමට කාලයයි

**කි**තුල් යනු කර්යෝටා යුරේනස් (*Caryota urenas*) යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් ද, පාලි භාෂාවෙන් **“හින්තාල”** යනුවෙන් ද, බෞද්ධ සාහිත්‍යයේ **“කිතුල්”** යන නාමයෙන් ද හඳුන්වනු ලබන ශාකයකි. තව ද, කිතුල් ශාකය කඳු තල්, සාගෝ තල්, රා තල්, හකුරු තල්, මාළු වලිග තල් ලෙස ද හඳුන්වා ඇත. මේ ශාක විශේෂය “පැල්මිසියා” පවුලට අයත් ය.

කිතුල් මෘදු වලයාකාර කඳක් සහිත දැකුම්කළු තල් ගසකි. එය දකුණු ආසියාතික රටවල හා තෙතමනය සහිත දේශගුණික කලාපවල දක්නට ලැබෙන තාල වර්ගයට අයත් ගසක් ලෙස සැලකේ.

ශ්‍රී ලංකාවේ සියලුම ස්වාභාවික දේශගුණික කලාපවල වෙනත් ගස් වර්ග සමග මිශ්‍රව කිතුල් වගාව දක්නට ඇතත් එහි ආර්ථිකමය වැදගත්කමක් දකින්නට ඇත්තේ මැදරට හා පහතරට කලාපයන්හි ය. කෙසේ වෙතත් කිතුල් බහුලව දක්නට ලැබෙන්නේ මුහුදු මට්ටමේ සිට අඩි 2000-2800 දක්වා උසැති, තරමක් සම සේ ව්‍යාප්ත වූ අධික වර්ෂාපතනයක් සහිත ප්‍රදේශයන්හි වේ.

ශ්‍රී ලංකාවේ කිතුල් වගාව රාශිගත වී ඇති ප්‍රදේශ ලෙස නුවර, මාතලේ, රත්නපුර, රක්වාන, මාතර උතුරු ප්‍රදේශය, පහළ ඌව හා මොණරාගල යන ප්‍රාථමික ප්‍රදේශ ද, කොළඹ, කළුතර, ගාල්ල, කෑගල්ල, කුරුණෑගල හා බදුල්ල යන දිස්ත්‍රික්ක ද හැඳින්විය හැකිය (මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ කිතුල් කර්මාන්තය දියුණු කිරීම, ආරිය අබේසිංහ). කිතුල් වාණිජ වගාවක් වශයෙන් සිදු නොකළ ද, තෙත් කලාපයේ බොහෝ ඉඩම්වල එක් ගසක් හෝ කිහිපයක් දක්නට හැකිය. ශ්‍රී ලංකාවේ කිතුල් ශාකයේ ව්‍යාප්තිය සාර්ථකව සිදුවී ඇත්තේ “උගුඩුවා” යන සත්ත්ව විශේෂය නිසාවෙනි. *(මූලාශ්‍රය - කිතුල් කප් රුකකි, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2004)*

### ආර්ථික හැකියාව

ග්‍රාමීය ආර්ථිකයේ වැදගත් ස්ථානයක් කිතුල් ශාකයට හිමි වන අතර කිතුල් ආශ්‍රිත කර්මාන්ත ග්‍රාමීය ජනතාවගේ ස්වයං රැකියා මාර්ගයක් ද වී ඇත. පොල් ගස කප්රුකක් සේ හඳුන්වනවා සේම, කිතුල් ගස ද කප්රුකක් සේ හැඳින්වීම නිවැරදිය. ඒ කිතුල් ගසේ සෑම කොටසක් තුළින්ම ආර්ථික වටිනාකමක් උකහා ගත හැකි නිසාවෙනි.


- කිතුල් මලෙන් ප්‍රධාන වශයෙන් මීරා (තෙලිදිය), රා ලබා ගැනීම, පැණි හා හකුරු සාදා ගැනීමට ඇති හැකියාව
- කිතුල් කඳේ මධ්‍යස්ථ කොටසින් කිතුල් පිටි නිෂ්පාදනය
- කිතුල් කෙඳිවලින් බුරුසු හා වෙනත් විසිතුරු භාණ්ඩ සෑදීම
- කිතුල් ලී ඉතා තද හෙයින් ගෘහ උපකරණ හෝ ගෘහ නිර්මාණ කටයුතු සඳහා යොදා ගැනීමට ඇති හැකියාව
- කිතුල් බඩය හා නොමේරූ අතු එළවළුවක් ලෙස ද භාවිතයට ගැනීම
- මේරූ කොල, අතු, කඳ අලින්ගේ ආහාරයක් ලෙස ද, අපනයනය කිරීම සඳහා ද භාවිතා කිරීම.
- කිතුල් කොළ ගෘහ අලංකාරය සඳහා ද භාවිතා කිරීම.

26 පිටුවෙහි රූප සටහනට අනුව කිතුල් ගස කප්රුකක් බව මනාව පැහැදිළි වේ.

- පැණි හා හකුරුවලට විදේශීය මෙන්ම දේශීය වෙළඳපොළේ හොඳ ඉල්ලුමක් පවතී. වාර්ෂිකව විශාල විදේශ විනිමය ප්‍රමාණයක් සීනි ආනයනය සඳහා වැය කරන ශ්‍රී ලංකාව වැනි දියුණුවන රටක සීනි වෙනුවට ආදේශකයක් ලෙස හකුරු යොදා ගැනීමට හැකිය.

රූප සටහන - 1

## කිතුල් ගසේ ආර්ථික භාවිතයන්



- තව ද, සීනි වෙනුවට හකුරු භාවිතා කිරීම දියවැඩියා රෝගීන්ට ඖෂධයක් ලෙස ද දේශීය වෛද්‍ය විද්‍යාවේ නිර්දේශ කර තිබේ. මේ තුළින් දියවැඩියා රෝගීන් සඳහා රජය වැය කරන වියදමේ කිසියම් ප්‍රතිශතයක් අඩු කර ගැනීමට හැකිවනු ඇත.

- කිතුල් කෙඳි අපනයනය තුළින් ද අපට විදේශ විනිමය උපයා ගත හැකි ය.

මෙවැනි තත්ත්වයන් යටතේ ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නංවාලීමට බොහෝ සෙයින් කිතුල්ගස උපකාර වන අතර ඒ හේතුව නිසාම කිතුල් නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ.

ඈත අතීතයේ සිට කිතුල් වගාව පැවතුන ද ක්‍රමවත් අපනයනයක් සිදුවී ඇත්තේ 1893 වර්ෂයේ සිට සිදු වී ඇති බව පහත සඳහන් වගුව පරීක්ෂා කිරීමේදී පැහැදිළි වේ. ඒ අනුව කිතුල් හකුරු හා කිතුල් කෙඳි, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය, ප්‍රංශය හා නෙදර්ලන්තය යන රටවලට අපනයනය කර ඇත.

ඩී.ජේ මැක් කොනෙල්, UNDP/SFFA බෝග විවිධාංගීකරණ ව්‍යාපෘතිය, සැප්තැම්බර් 1973). වර්තමානයේදී කිතුල් අපනයනය පිළිබඳ පැහැදිළි වාර්තා සොයා ගත නොහැකි වුවද එය දළ වශයෙන් වසරකට මෙ.ටො. 30 ක් පමණ වේ (මූලාශ්‍රය - කිතුල් කර්මාන්තයට අදාල යහපත් නිෂ්පාදන පිළිවෙත්, එම්.ඒ.පී.කේ. සෙනෙවිරත්න).

එමෙන්ම, ශ්‍රී ලංකාවේ කිතුල් කර්මාන්තය සිදු කරන ගම් 640 ක් ඇති බව හඳුනාගෙන ඇත. මෙම ගම්මාන කෑගල්ල, රත්නපුර, නුවරඑළිය, බදුල්ල, මහනුවර, හම්බන්තොට හා මාතලේ යන දිස්ත්‍රික්ක තුළ විසිරී පවතී. දැනට තිබෙන කිතුල් ගස්වලින් 20% ක් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වේ. මෙම නිෂ්පාදනවලින් 96% ක් වෙළඳපොළට එක් වන අතර ඉන් 60% ක් පැණි හා හකුරු වශයෙනි. කිතුල් කර්මාන්තය සඳහා රාජ්‍ය අනුග්‍රහය වැඩිපුරම ලැබුණ කාලසීමාව ලෙස පසුගිය දෙවසරක කාලය හැඳින්විය හැකිය. 2003 වර්ෂයේ කිතුල් මල් මැදීම සඳහා බලපත්‍ර ක්‍රමය යළි ආරම්භ කළ අතර රු.250/- බලපත්‍ර ගාස්තුව රු.50/- දක්වා අඩු කරන ලදී.. කිතුල් වගාව සංවර්ධනය කිරීම සඳහා 1970 දශකයේ මැද භාගයේ අභාවප්‍රාප්ත

වගුව : 1

**කිතුල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය**

| වර්ෂය | කිතුල් කෙඳි හො. | කිතුල් හකුරු හෙ. | අපනයන රට |
|---|---|---|---|
| 1893 | 2,248 | 7,510 | එක්සත් රාජධානිය ඉන්දියාව |
| 1894 | 3,026 | 5,192 | බෙල්ජියම |
| 1895 | 3,008 | 1,187 | ජර්මනිය |
| 1896 | 2,037 | 2,380 | ඕස්ට්‍රේලියාව |
| 1897 | 2,189 | 2,636 | ප්‍රංශය/නෙදර්ලන්තය |

*මූලාශ්‍රය: එන්.ඒ.පී.පී.කේ. සෙනෙවිරත්න, කිතුල් කප්රුකකි, 2004*

තව ද 1968-1971 කාලය තුළ කිතුල් කෙඳි හොන්ඩර 300 ක් එංගලන්තයට හා ජර්මනියට අපනයනය කර ඇති බව ඉහත මූලාශ්‍ර සඳහන් කරයි. එසේම ප්‍රධානතම කිතුල් වැවෙන ප්‍රදේශයක් වූ කොත්මලේ ගම්මාන 35 ක කිතුල් ගස් 10,200 ක් තිබී ඇති අතර, ඉන් කිතුල් ගස් 6,000 ක කිතුල් ආශ්‍රිත නිෂ්පාදන (කිතුල් හකුරු, කිතුල් පැණි සෑදීම) සඳහා යොදා ගෙන ඇත (මූලාශ්‍රය -

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා වැවිලි කර්මාන්ත ඇමතිවරයාව සිටි වකවානුවේ උත්සාහයක් දරා ඇත.

මෙය පළමු ප්‍රයත්නය ලෙස හඳුන්වනු ලබන අතර දෙවන ප්‍රයත්නය වූයේ කඳු රටෙහි ගිනිගත්හේනේ සිට පැතිර ඇති නිසරු, මුඩු බිම්වල තණබිම් හා කිරිපට්ටි සංවර්ධනයත් සමඟ කිතුල් වැවිය යුතු

බවට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් නිර්දේශ කිරීමයි. මේ ව්‍යාපෘති සැලසුම්කරණ ලද අදියරින් ඔබ්බට ගොස් නැත. (මූලාශ්‍රය - අබේසිංහ, ඒ. 1974)

සියලු තත්ත්වයන් එසේ වුවද, ආචාර්ය එච්.ඒ.ටී. ගුණතිලක (පොල් පර්යේෂණ ආයතනය) මහතා සඳහන් කරන ආකාරයට එක් කිතුල් ගසකින් දිනකට තෙලිදිය බෝතල් 10-13 අතර ප්‍රමාණයක් ලබා ගත හැකිය. සාමාන්‍ය තත්ත්ව යටතේ එක් මදින්නෙකුට දිනකට ගස් 3-4 මැදිය හැකි වන අතර ලබා ගත හැකි තෙලිදිය බෝතල් ප්‍රමාණය 35-40 පමණ වේ. මෙම ප්‍රමාණයෙන් කිතුල් හකුරු කි.ග්‍රෑම් 4 1/2ක් නිෂ්පාදනය කළ හැකිය. කිතුල් හකුරු කි.ග්‍රෑ. එකක මිල රු.150/- ලෙස ගත් විට මෙයින් රු.675/- පමණ මුදලක් ඉපැයිය හැකිය.

වර්තමානයේ කිතුල් කර්මාන්තය දියුණු කරලීමට ආයතන රැසක් මැදිහත්ව කටයුතු කරනු ලබයි.

- විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය අනුබද්ධිත කාර්මික තාක්ෂණ ආයතනය (ITI) මඟින් කැස්පර් (KASPER) නම් මල් මැදීමට, කිතුල් මල සක්‍රිය කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිකාරකයක් හඳුන්වා දී ඇත. මේ තුළින් පාරම්පරිකව පැවත ආ මල් තැලීමට යොදන සාම්ප්‍රදායික ද්‍රව්‍ය ඉවත් වන අතර නව තාක්ෂණය යටතේ මල් මැදීම සිදු වේ.
- විද්‍යාතා මධ්‍යස්ථානය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති ආයතනයකි. එම ආයතනය කැස්පර් මඟින් කිතුල් මල් පදම් කිරීමේ නව තාක්ෂණය ප්‍රචලිත කිරීම සිදු කෙරේ.
- කාර්මික සංවර්ධන ආයතනය දැනට මල් පදම් කිරීමේ කැස්පර් බෙදා හැරීමේ කටයුතුවල වගකීම දරන ආයතනය වේ.
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කිතුල් පැල නිෂ්පාදනය හා බෙදා හැරීම සඳහා දායක වේ. කිතුල් ක්ෂේත්‍රයට අදාල පුහුණුකිරීම් මාතලේ පිහිටි පුහුණු ආයතනය මඟින් සිදු කරනු ලබයි.
- අපනයන සංවර්ධන මණ්ඩලය මඟින් කිතුල් නිෂ්පාදනය සඳහා වෙළඳපොළ සොයා දීම සිදු කරන අතර අපනයනකරුවන් හා ගැණුම්කරුවන් අතර සම්බන්ධතාව ඇති කරවයි.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කිතුල් නිෂ්පාදනය සඳහා ප්‍රමිතීන් සකස් කිරීමේ වගකීම් දරණ ආයතනය වේ.

ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදිතයට විශාල දායකත්වයක් ලබා දිය හැකි හා ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථික හා සමාජීය තත්ත්වයන් වර්ධනය කරලීමට හැකි කප්රුකක් වන් කිතුල් බෝගය වාණිජ වගාවක් ලෙස වර්ධනය කරලීම ජාතික අවශ්‍යතාවයක් ලෙස හැඳින්විය හැකිය.

අනාදිමත් ඉතිහාසයක් ඇති කිතුල් කර්මාන්තය සමාජය පිළි නොගන්නා කර්මාන්තයක් ලෙස පැවතීම සම්බන්ධව අප සියලු දෙනාම වගකිව යුතු අතර විශාල මූලික පිරිවැයකින් තොරව ස්වාධීන රැකියාවක් ලෙස දියුණු කළ හැකි තිරසාර කර්මාන්තයක් වශයෙන් කිතුල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කළ හැකිය. අනෙකුත් නිෂ්පාදන කර්මාන්තවලට සාපේක්ෂව මිල හෝ වෙළඳපොළ පිළිබඳ දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද, කිසිදු ගැටළුවක් ඇති නොවන බවට සාධක ඇත. ග්‍රාමීය මට්ටමේ පවතින විරැකියාව හා දිළිඳුකම අවම කිරීම සඳහා භාවිතා කළ හැකි විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස ද කිතුල් කර්මාන්තය හැඳින්විය හැකිය.

මේ තත්ත්වයන් නිසාම මෙවන් විශාල වැදගත්කමක් ඇති කිතුල් බෝගයේ පැවැත්ම සහ එයින් ලබාගත හැකි මූල්‍යමය ප්‍රයෝජන දුප්පත් ග්‍රාමීය ජනතාවට තිළින කර දීම වගකිවයුත්තන්ගේ යුතුකමක් හා වගකීමක් වේ.

**එස්. ඇපාසිංහ**

*පර්යේෂණ නිලධාරී*

**කෘෂි හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය